**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2023**

**-----------------------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව, | | | |
| (i) | ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගත ලෙස තෝරාගෙන ව්‍යවහාර කළ යුතු අතර ස්ව කැමැත්තෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වෙනස්කරන විට ඒ බව හෙළිදරව් කළ යුතු වේ. කෙසේවුවද, පෙර වර්ෂයේ වක්‍ර ක්‍රමය අනුව ඉදිරිපත් කරන ලද අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමාලෝචිත වර්ෂයේ දී ඍජු ක්‍රමය අනුව ඉදිරිපත් කළද, ඒ බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. ඉදිරියේදීඑවැනි ප්‍රතිපත්තිමය වෙනස් කිරීම් වලදී රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව හෙළිදරව් කිරීමට සටහන් කරගන්නා ලදී. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වියයුතු බව |
| (ii) | පූර්ව කාලපරිච්ඡේදයකට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියක්, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමක් සහ වැරැද්දක් අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම මඟින් නිවැරදි කළ යුතු වුවද, එවැනි සංශෝධනයක් සිදු කර නොතිබියදී 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පසුගිය වර්ෂයට අදාළ තොරතුරු අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම් ලෙස වැරදියට දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම්වල ප්‍රකාශිත අගයන් සඳහා කිසිදු සංශෝධනයක් සිදු කර නොමැති බව සඳහන් කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වියයුතු බව |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රේගුවේ අංශ ගණනාවක් විසින් භාණ්ඩ රාජ සන්තක කිරීම, ඒවා විකිණීම, දණ්ඩන පැනවීම සහ එම මුදල් එකතු කිරීම සිදු කරන | සියලු දඩ හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායම් ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා වූ තාවකාලික රඳවා ගැනීමේ තැන්පතු ගිණුමට බැර කරනු ලබයි. ඇතැම් විමර්ශන අවසන් වූ පසු විමර්ශනයට | ශ්‍රී ලංකා රේගුවේ සියළුම අංශවලට අදාළව ගෙවිය යුතු වටිනාකම මූල්‍ය |

| | | |
|---|---|---|
| නමුත් වර්ෂයට අදාළව සමස්ත රේගුවේ රාජ සන්තක කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුළු ආදායම සහ ලැබිය යුතු මුළු දණ්ඩන ආදායම පිළිබඳ විස්තර මුල්‍ය අංශයට ලබාදීමේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු බැවින් මෙම අරමුදලෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල වූ රු.80,379,402 ක වටිනාකම ගෙවීම් සඳහා මුල්‍ය අංශයට ලද ගොනු අනුව පමණක් ගණනය කරන ලද්දක් විය. ඒ අනුව වර්ෂය අවසාන දිනට මුළු ගෙවිය යුතු ත්‍යාග මුදල ලෙස මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය කෙරේ. | අදාල දඩ මුදල්, අදාල පුද්ගලයන් වෙත ආපසු ගෙවීමට සිදුවන අවස්ථා ඇත. තවද, මෙසේ තැන්පත් කරනු ලබන මුදල් වලින් විමර්ශන වලට අදාල වියදම් දැරීමට ද සිදු වේ .එබැවින් එම වියදම් අඩුකර ඉතිරි මුදල් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට(50%) , කළමනාකරණ වන්දි අරමුදලට (20%) සහ රාජ්‍ය ආදායමට (30%) වශයෙන් බැර කරනු ලබන්නේ විමර්ශන ගොනුව අවසන්ව ත්‍යාග ගොනු ගෙවීම සිදු කරන අවස්ථාවේදීය. එබැවින් ලැබිය යුතු දණ්ඩන ආදායම් ගිණුම්ගත කිරීම සඳහා නිශ්චිත මුදලක් හඳුනා ගැනීම, අදාල විමර්ශනය අවසන් වන තෙක් සිදු කළ නොහැකි බැවින්, ඉහත විස්තර කළ පදනමින් ගිණුම් පවත්වා ගෙන යනු ලැබේ. ඉදිරි වර්ෂයන්හි අවසාන ගිණුම්වල මෙම තත්ත්වය විශේෂ හෙළිදරව් කිරීම් යටතේ හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු බව. |

### 1.5.3 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (ආ) 1 වගන්තිය ප්‍රකාරව දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක් ද කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක් ද වශයෙන් දායක විය යුතු විය. ඒ අනුව ත්‍යාග අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගත් සියයට 50 ක දායකය වූ රු.5,611,873,320 ට සමානුපාතිකව කළමනාකරණ හා වන්දි අරමුදලේ සියයට 20 ක දායකය රු.2,244,749,328 ක් විය යුතු වුවද කළමනාකරණ හා වන්දි අරමුදලේ ආදායම ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණේ රු.2,463,397,190 ක් වීම නිසා ආදායමේ රු.218,647,862 ක නොසැසඳීමක් විය. | 2023 වර්ෂයේ දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා 50% ක් වූ ආදායමට, 2023 වර්ෂයේ මුළු ගොනුව සඳහා ගෙවීම් කළ ද, කොටස් ගෙවීමක් ඊට පෙර වර්ෂයේදී සිදු කර ඇත්නම් එම මුදලද තවත් ගොනුවක් සඳහා ගෙවීම් කිරීමේදී ත්‍යාග අරමුදල සඳහා ගිණුම් ගත නොකළ මුදලක්ද එකතු කර තිබුණි. | දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදලට සියයට 50 ක් බැර වන විට ඊට සමානුපාතිකව සියයට 20ක් මෙම අරමුදලට බැර විය යුතු බව. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වත්කම් කාණ්ඩ 02ක් යටතේ පිරිවැය රු.123,465,297 ක් සහ සමුච්චිත ක්ෂය 118,179,542 ක් වූ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එකී වත්කම් සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ආදි තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | 123,465,297 | ස්ථාවර වත්කම් ලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, රඳවා ඇති ස්ථාන ආදි තොරතුරු | වත්කම් සත්‍යාපනය හා සංනිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන පරිදි ඉදිරියේදී ලේඛණ සකස් කිරීමට සටහන් කරගත් බව සඳහන් කරමි. | වත්කම් සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ලිපි ලේඛන නඩත්තු කළ යුතු බව |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1993 නොවැම්බර් 05 දිනැති අංක 792 දරන ගැසට් පත්‍රය | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මුදල් බැහැර කළ හැකි ප්‍රධාන රීති 5ක් හඳුන්වා දී තිබුණු අතර එකී රීතිවලින් ප්‍රතිපාදන සලසා නැති එහෙත් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස අනුව දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සාපල්‍යය සඳහා අවශ්‍ය යම් විශේෂ වැඩ සටහනක් වෙතොත් මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව දැරිය හැකි බව දක්වා තිබුණ ද කළමනාකරණ , සාපල්‍යය ඉහළ යාමට ඍජු සම්බන්ධතාවයක් නොමැති සංග්‍රහ වියදම් සඳහා රු 554,984 ක් මෙම අරමුදලින් දරා තිබුණි. | රේගු ආඥා පනතේ 153 (අ) 1 වගන්තිය අනුව රේගු කළමනාකරණයේ සඵලතාවය වැඩිදියුණු කිරීම පිණිස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීමට හැකි වන අතර විගණන වාර්තාවේ දක්වා ඇති වියදම් 1993.11.05 දිනැති අංක 792 ගැසට් පත්‍රයේ ප්‍රතිපාදනයන්ට යටත්ව සිදුකර ඇත. ඒ අනුව අමාත්‍යවරයාගේ විශේෂ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. | ගැසට් පත්‍රයේ විධි විධානයන්ට අනුකූල විය යුතු බව. |
| (ආ)2023 ජනවාරි 27 දිනැති අංක 2023/01 දරන ජාතික අයවැය චක්‍රලේඛය | හැකි සෑම අවස්ථාවකම පුනරාවර්තන සහ මෙහෙයුම් වියදම් අවම කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට | 2023 ජාත්‍යන්තර රේගු දින උත්සවයට අදාල වියදම් දැරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/BE1/02/05/01 හා | චක්‍රලේඛයට අනුකූල විය යුතු බව. |

| | |
|---|---|
| උපදෙස් දී තිබියදී සමාලෝචිත වර්ෂයේ රේගු දිනය වෙනුවෙන් වූ උත්සවයට රු. 975,941 ක මුදලක් මෙම අරමුදලෙන් වැය කර තිබුණි. | 2023.01.11 දිනැති ලිපිය අනුව තත්කාර්ය අතුරු අග්‍රිමයක් මගින් අවසර ලබා ගෙන එම නිල උත්සවය පැවැත්වීම වෙනුවෙන් අදාල මුදල වැය කර ඉතිරි මුදල නිරවුල් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,400,069,243 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,499,675,714 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.900,393,529 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දණ්ඩන මුදල් ආදායම රු. 1,126,202,914 ක් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ආනයනකරුවෙකු විසින් ඔහුට අදාළව සිදුකරන ලද රේගු විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් පැනවූ අභිමිකිරීමක් සහ දණ්ඩනයකට එරෙහිව නඩුවක් පවරා තිබුණු අතර ඉන් රේගුව අයකර ගත් මුදලින් රු.31,000,000 ක් ආනයනකරුට ආපසු ගෙවීමට සිදු වී තිබුණි. අභිමිකිරීම් සහ දණ්ඩන වටිනාකමින් සියයට 20ක් පමණක් මෙම අරමුදලට බැර වෙන නමුත් උසාවි තීන්දුව අනුව ආනයනකරුට ගෙවිය යුතු වන්දි මුදල ගෙවීම සඳහා මෙම අරමුදලට බැර වූ සියයට 20 ක වටිනාකම වූ රු.12,000,000 ක මුදල සහ රජයේ ආදායමට බැර වූ රු.18,000,000 ක මුදල සම්පූර්ණයෙන් ආපසු ලබාගෙන තිබූ අතර ත්‍යාග මුදල් ලබාගත් නිලධාරීන් ආසන්න වශයෙන් 541 ක් පමණ සිටියදී ඔවුන්ගෙන් කිසිදු මුදලක් ආපසු අයකර ගෙන නොතිබුණි. | ත්‍යාග ගොනුව සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමේදී, ත්‍යාග ගොනුවට අදාල නිලධාරින්ට මෙන්ම සංචිත අරමුදල්(Pool) වෙනුවෙන් වෙන්කළ මුදල්වලින් නිලධාරීන් 541 කට ආසන්න පිරිසකට මුදල් ගෙවා තිබීමත් රු.2,716,696 ක් රජයේ බදු ලෙස ගෙවා තිබීමත් නිසා<br>එම මුදල අය කිරීමට ප්‍රායෝගිකව අපහසු බව පෙන්වා දීමෙන් පසු අදාල ආනයනකරු එම නිලධාරීන්ගෙන් අය කර ගැනීමකින් තොරව ගෙවිය හැකි මුදල පමණක් ලබා ගැනීමට එකඟවීම මත ආපසු ගෙවා ඇත. | අධිකරණ තීන්දු අනුව රේගුව විසින් සිදුකරන ලද අභිමි කිරීම් සහ දණ්ඩන නැවත ගෙවීමට සිදු වූ විට ත්‍යාග ලබාගත් නිලධාරීන්ගෙන්ද ආපසු අයකර ගැනීම සිදු විය යුතු බව |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 20 කට සමාන මුදල් ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කරනු ලබන අතර රේගු ආඥා පනතේ 153 (ආ) 1 වගන්තිය අනුව අරමුදලේ කාර්යයන් පහත සඳහන් පරිදි විය.<br>• රේගු කළමනාකරණයෙහි සාඵල්‍යය වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීම.<br>• ස්ථිර වශයෙන් හෝ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලික අශක්නුතාවයකට පත් වූ යම් රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම.<br>• යම් රේගු නිලධාරියෙකු මිය ගිය විට ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට වන්දි ගෙවීම.<br><br>ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ. | | |
| (අ)ශ්‍රී ලංකා රේගුවේ කළමනාකරණ සාපලා අරමුණු කරගනිමින් 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 7ක කාලපරිච්ඡේදය තුළදී නිලධාරීන් 337 ක් සඳහා පශ්වාත් උපාධි පාඨමාලා හැදැරිමට කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කළ මුදල රු. 131,978,786 ක් විය. කෙසේවුවද, ඉන් පාඨමාලා අවසන් කර සහතික පත්‍ර ඉදිරිපත් කර තිබුණේ 162 දෙනෙක් පමණක් වූ අතර ඉතිරි නිලධාරීන් 175 ක් එම පාඨමාලාව සාර්ථකව අවසන් කළාද, අත්හැරියේද යන්න පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි. | 2017 – 2022 දක්වා පශ්වාත් උපාධි පාඨමාලා සාර්ථකව අවසන් කළාද අත්හැරීයේද යන්න තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණත් 2023 වර්ෂයේදී මෙම තොරතුරු පරිසනක ගත කිරීම ආරම්භ කළ අතර, ඉදිරියේදී යම් නිලධාරියෙකු පශ්වාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ඉහත කී අරමුදලෙන් යම් මුදලක් ලබා ගෙන එම පාඨමාලා අතරමඟ අත්හැර ඇති බව අනාවරණය වුවහොත් එම නිලධාරීන් සමඟ රේගු දෙපාර්තමේන්තුව මුලදීම අත්සන් කර ඇති ගිවිසුම අනුව එම මුදල ඔහුගේ / ඇයගේ මාසික වේතනයෙන් අයකර ගැනීමටද ක්‍රියාකරන බව සඳහන් කළ යුතුය. එසේම වාර්ෂිකව අදාල පශ්වාත් උපාධි ආයතනය මගින් උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය විමසීමට ද කටයුතු කරනු ඇත. | පාඨමාලා අවසන් කළ බවට තහවුරු කරගත යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ)2023 වර්ෂයේ දී පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අරමුදලින් මුදල් ලබා ගත් නිලධාරීන් 13 ක් 2024 මාර්තු 28 දින වන විට පාඨමාලා සම්පූර්ණ කර සහතිකපත් ඉදිරිපත් කර ඇති බව විගණනයට දන්වා තිබුණ ද පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමේදී ඉන් නිලධාරීන් 08 ක් පාඨමාලා අවසන්කර අදාළ සහතික පත්‍ර ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කර සහතික පත්‍ර ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | පාඨමාලා අවසන් කළ බවට තහවුරු කරගත යුතු බව. |
| (ඇ)රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සාඵල්‍යය වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,090 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2023 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 12,490 ක් දක්වා රු. මිලියන 2,400 න් හෙවත් සියයට 24 කින් වර්ධනය වී තිබුණි. එනම් සමාලෝචිත වර්ෂයේ ආදායමින් සියයට 96 ක්ම අරමුදල තුළ සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය. අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික ලෙස බලපා තිබුණි. | | |
| (i) රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා කෘතීම බුද්ධිය සම්බන්ධ කරන ලද දියුණු ක්‍රමවේද හඳුන්වා දීමට ප්‍රමාණවත් පියවර නොගැනීම නිසා සහ නිලධාරින්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු තුළදී හඳුනා ගන්නා විවිධ රේගු වැරදි සඳහාම බහුල වශයෙන් ත්‍යාග ගෙවීමට සිදුවීමත් ඉන් සියයට 20 කට සමාන ප්‍රතිශතයක් මෙම අරමුදලට බැර වීමත් හේතුවෙන් මෙම අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබුණි. | විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | රේගු බදු වංචාවන් පාලනය කිරීමට නවීන තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දියයුතු බව. |
| (ii) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී එම දණ්ඩන වටිනාකමෙන් මෙම අරමුදලට සියයට 20 ක් සහ රජයට සියයට 30 ක් බැර වේ. සමහර අවස්ථාවල දී වංචා කිරීමට උත්සාහ කළ භාණ්ඩ සහ බදු වටිනාකමට සාපේක්ෂව | රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ සඳහන් (අ) උප ලේඛනයේ දක්වා ඇති ප්‍රතිපාදන පරිදි රේගු බදු අයකර ගැනීම සිදු කරනු ලබයි. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන ආදායම් සංරක්ෂණ නියෝග | රජයට ලැබෙන ආදායම සුරක්ෂිත කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | තෙගුණයක වටිනාකමක් දක්වා දණ්ඩන පැනවීම, රේගු වැරදිවල කැපී පෙනෙන අඩුවීමක් සිදු වී නොතිබීම, වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම ආදී හේතු නිසා මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් ද සිදු වී තිබුණි. | මගින් ඒ ඒ භාණ්ඩවලට අදාළව තීරුබදු ප්‍රමාණයන් ප්‍රකාශයට පත්කරනු ලැබේ. රජයට ලැබිය යුතු බදු මුදල් අයකර ගැනීමෙන් පසු එම මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ. රේගු දණ්ඩන පැනවීම හෝ භාණ්ඩ රාජසන්තක කිරීම රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව පමණක් සිදු කරනු ලබන අතර, එසේ සිදු කරනු ලබන්නේ යම් ආනයනයක් හෝ අපනයනයක් කිසියම් රේගු නීතියක් උල්ලංඝණය කරමින් ආනයනයට හෝ අපනයනය හෝ කිරීමට උත්සාහ කර ඇති අවස්ථාවකදී වන අතර, එබඳු නෛතික උල්ලංඝනය කිරීමකට අදාළ භාණ්ඩ "නීති විරෝධී භාණ්ඩ" බැවින් ඒ මත බදු අයකිරීමක් සිදු කළ නොහැකි අතර, රේගු ආඥා පනතේ අදාළ වගන්ති ප්‍රකාරව ක්‍රියාකරමින් භාණ්ඩ රාජසන්තක කිරීම හෝ දණ්ඩන පැනවීම පමණක් සිදු කළ හැකිය. එබැවින්, බදු පැනවීම සිදුකළ හැක්කේ සාමාන්‍ය ක්‍රමවේදය යටතේ සිදුකරන ලද නීත්‍යානුකූල ආනයනයන් සම්බන්ධව පමණකි. රේගු විමර්ශන වල සහ රේගු දණ්ඩන පැනවීමේ මූලික අරමුණු වනුයේ රේගු නීතිය කඩ කරන පාර්ශව රේගු නීතියේ රැහැනට හසු කර ගැනීම, ඔවුනට දඬුවම් ලබාදීම සහ අදාළ පාර්ශව අතර රේගු නීතිය උදෙසා වන අනුකූලතාවය සහ අනුගතවීම ඉහළ නැංවීමයි. | |
| (ඉ) | මෙම අරමුදලේ මූලික අරමුණුවලින් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණ ද පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 10 ක කාල පරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි. | ඉහත වර්ෂ 10 තුල එවැනි ආපදාවන් වෙනුවෙන් වන්දි ඉල්ලීම් කිසිවක් ලැබී නොතිබිණි. තවද , රේගු වැටලීම් සඳහා දැඩි කැපවීමකින් කටයුතු කරන අවංක නිලධාරීන්හට ජීවිත තර්ජනද ඇති වී ඇති බැවින්, එම නිලධාරීන්ට ජීවිත අවධානම ද නොතකා රාජකාරි වෙනුවෙන් කැපවීමට මෙවැනි අරමුදලක විශාල මුදලක් පැවතීම රක්ෂණ අරමුදලක් මෙන් ඔවුන්ගේ පවුල්වලට සුරක්ෂිතභාවයක් තහවුරු කරයි. එය නිලධාරීන්ගේ රාජකාරි ඉටු කිරීමේදී ජීවිත අවධානම් නොතකා | අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩවම වර්ධනය වීම සමාලෝචනය කළ යුතු බව. |

| | | |
|---|---|---|
| | රාජකාරි සඳහා කැප වීමට දිරිගැන්වීමක් සිදු කරයි. එසේම මෙම අරමුදලට මෙසේ මුදල් වෙන් කිරීම රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර සිදු කරනු ලබන බව වැඩිදුරටත් වාර්තා කරමි. | |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 04 ක අරමුදලේ එකතු ආදායම රු. 6,138,888,719 ක් වූ අතර එම කාලපරිච්ඡේදය තුල අරමුදලින් වැය කර තිබූ මුදල (ක්ෂයවීම් හැර) රු. 364,303,235 ක් විය. ඒ අනුව මුළු ආදායමෙන් සියයට 6 ක් පමණ ඉතා අඩු ප්‍රතිශතයක් අරමුදලින් වියදම් කර ඉතිරි සියයට 94 ක් අරමුදලට එකතු කර තිබීම හේතුවෙන් අරමුදලට වාර්ෂිකව වෙන් කරන ප්‍රමාණය පිළිබඳ සමාලෝචනයක් සිදු කළ යුතුව පැවතුණි. | විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩවම වර්ධනය වීම සමාලෝචනය කළ යුතු බව. |